# 10 ශ්‍රේණිය

# නර්තනය

## දේශීය අවනද්ධ භාණ්ඩ



අන්තර්ගතය - වී.ඒ.කේ.පී. සජීවනී - බප/කැල/සාන්ත ෆ්‍රැන්සිස් ම.වි., කැලණිය
සැකසුම - ජී.ඒ.ඩී. තාරකා - මාර/ මහින්ද රාජපක්ෂ විද්‍යාලය , මාතර

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# දේශීය අවනද්ධ භාණ්ඩ

ලංකාවේ දේශීය නර්තන සම්ප්‍රදායන් 3ක් ඇතිවා සේම එකී නර්තන සම්ප්‍රදායන්ටම ආවේණික වූ ප්‍රධාන අවනද්ධ භාණ්ඩයන්ද වර්ග 03 කි.

- උඩරට නර්තන සම්ප්‍රදාය - ගැට බෙරය
- පහතරට නර්තන සම්ප්‍රදාය - යක් බෙරය
- සබරගමු නර්තන සම්ප්‍රදාය - දවුල

එම අවනද්ධ භාණ්ඩ ත්‍රිත්වයම

- බෙර සැකසීමේදී භාවිතා කරන දැව වර්ග
- හම් වර්ග
- බෙරයේ හැඩය
- නියමිත දිග ප්‍රමාණය

වලින් වෙන්කොට හදුනා ගත හැකිය.


e තක්සලාව The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# දේශීය අවනද්ධ භාණ්ඩ

- උඩරට නර්තන සම්ප්‍රදාය -

  ගැට බෙරය / උඩරට බෙරය



- පහතරට නර්තන සම්ප්‍රදාය -

  යක් බෙරය / පහතරට බෙරය



- සබරගමු නර්තන සම්ප්‍රදාය -

  දවුල




Copyright © e-thaksalawa.moe.gov.lk

# උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය

- **උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය - ගැට බෙරය**

මෙහි කඳ මැද ගෙඩියක් / පුහුලක්/ බඩක්/ ගැටයක් මෙන් වූ බැවින් ඉහත සංඥා නාමයන් භාවිතා කරන බව පෙනේ.

ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිතයට නක්ෂත්‍රය කෙතරම් සමීප වූවාද ඔවුන් බෙර සැකසීමේදීද නැකැත් චාරිත්‍ර අනුව එම කටයුතු සිදු කර ඇත. උත්‍රසල හා පුනාවස නැකතින් බෙරය සෑදීම සඳහා අවශ්‍ය ගස කැපීම සිදුකරයි. තවද හෙණ යෝගයෙන් වාද්‍ය භාණ්ඩ සෑදීමෙන් මනා ශබ්ද මාධූර්යයක් ලබා ගැනීමට හැකි බව ඔවුන්ගේ විශ්වාසයයි.



- බෙරයක කඳක දිග - තුන් වියත් තුනඟුලකි.
- බෙර ඇස - විග්ගුස්සකි.
- බෙර සෑදීමට ගනු ලබන ලී වර්ග - ගංසූරිය, හල්මිල්ල, වරකා, ඇසළ


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

- **කැපුම් හම** - බෙර ඇසට උඩින් එහි ආරක්ෂාවට යොදා ඇති කැපුම් හම හරක් හම්, මුව හම් වලින් තරමක් ශක්තිමත් ලෙස යොදාගනු ලැබේ.
- **වරපටි** - බෙරයේ දෙපස ඇති හම (තට්ටුව) තද කිරීම හා බුරුල් කිරීම සඳහාත් එම තට්ටු බෙර කඳට සවි කර තැබීම සඳහාත් වරපට උපකාරී වේ. පදම් කල හරක් හම් වලින් අඟල් ½ ක් පමණ පළල පටි කපා ගෙන වරපටි සාදා ගනී.
- **කන්වර** - බෙර ලණුව හෙවත් බෙරයේ ඉනේ රඳවා ගැනීමට යොදන ලණුව බෙරය හා සම්බන්ධ කරනු ලබන්නේ කන්වරවලිනි.
- **වෙනිවර කැරැල්ල** - වෙනිවර යනු එකට වෙලා ඇති සිහින් හම් ගෙතුමකි. බෙර ගැටය සකස් කර ගැනීමට අවශ්‍ය වන වෙනිවර හරක් හම් හෝ මුව හම් වලින් ඉරටුවක සනකමට කපා තැලීමෙන් පසු රවුම් වැලක් ලණුවක් මෙන් සකස් කර ගන්නා ලද්දකි.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

- **කෛපුඩි වළල්ල** - දකුණු ඇසට සම්බන්ධ කන්වරයට යා කෙරෙන කෛපුඩි වළල්ල පිත්තලයෙන් සාදන ලද ගිගිරි වළල්ලකි. වාදකයා බෙරය වයද්දී කෛපුඩි වළල්ලේ අත වැදීමෙන් මතුවන හඬ වාදනයේ රස තිව්‍ර කිරීමට සමත් වේ.

- **බෙර ඇස** - බෙර ඇස වාදන ශිල්පියාගේ ඇඟිලිවල දිග ප්‍රමාණය මත සකස් වී ඇත.

  - දකුණු බෙර ඇසට - හරක් හම්, මුව හම්
  - වම් බෙර ඇසට - වඳුරු හම්, රිලා හම්, තලගොයි හම් යොදනු ලැබේ.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## උඩරට බෙරය




1 - බෙර පුහුල

2 - බෙර කඳ

3 - වම් බෙර ඇස

4 - දකුණු බෙර ඇස

5 - වරපටි

6 - ලණුව

7 - වෙනිවර කැරැල්ල

8 - කැපුම් හම

9 - කන්වරය

10 - කෛපුඩි වළල්ල


Copyright © e-thaksalawa.moe.gov.lk

# පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය

- **පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය - පහතරට බෙරය**

මෙම බෙරය සිලින්ඩරාකාර හැඩයකින් යුක්තය. පහතරට බෙරයේ ඇස හෙවත් තට්ටුව සඳහා ගනු ලබන්නේ හරක් බොක්කය. මෙය කිරි බොක්ක ලෙසද හැඳින්වේ.

- බෙරයක කඳක දිග - තුන් වියත් තුනඟුලකි.
- බෙර ඇස - එක් වියත් තුනඟුලකි.
- බෙර සෑදීමට ගනු ලබන ලී වර්ග - පොල්, කිතුල්, කොහොඹ, ඇසළ
- පහතරට බෙරය සඳහා භාවිතා වන වෙනත් නම්
  - රුහුණු බෙරය
  - සෝෂක බෙරය
  - දිග් බෙරය
  - යක් බෙරය
  - දෙවොල් බෙරය




The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## පහතරට බෙරය




1 - බෙර කඳ

2 - වරපටි

3 - වම් බෙර ඇස

4 - දකුණු බෙර ඇස

5 - කැපුම් හම

6 - වෙනිවර කැරැල්ල

7 - කන්වරය

8 - ළණුව


Copyright © e-thaksalawa.moe.gov.lk

# සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය

- සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය - දවුල

දවුල වූ කලී ශ්‍රී ලංකාවේ උඩරට, පහතරට, සබරගමු යන නර්තන සම්ප්‍රදායන් තුන තුළම දක්නට ලැබෙන අවනද්ධ භාණ්ඩයකි. කඩිප්පුව ලෙස හඳුන්වන ලී කෝටුවකින් සහ අතින් මෙය වාදනය කරයි. අතීතයේදී ලෝහ දවුල්, ජින දවුල් ආදීවශයෙන් දවුල් වර්ග රාශියක් තිබූ බව සාහිත්‍යගත තොරතුරු වලින් හෙලිවේ.මෙය රාජ්‍ය පරිපාලන කටයුතු වලටද උපයෝගී කර ගත් භාණ්ඩයකි. එය "අණ බෙරය" ලෙස හඳුන්වයි.



බෙර කඳ වටේට තබන ලද තරමක් විශාල වූ ගැටි වැල වටා බෙර තට්ටුව හොඳින් ඔතා ඒ තට්ටුවත් ගැටියත් අතරින් තව් කපා ලණු ඇද හොඳින් තද කර වාදනය සඳහා ගනී.


Copyright © e-thaksalawa.moe.gov.lk

# දවුල




- බෙරයක කඳක දිග - රියනක් පමණ
- බෙරයේ විශ්කම්භය - අඩියකුත් අඟල් 2-3ක් පමණ
- බෙර සෑදීමට ගනු ලබන ලී වර්ග - පොල්, කිතුල්, කොස්, ඇසළ, හල්මිල්ල, තල්
- කඩිප්පුව සඳහා - ඇට්ටේරියා
- කඩිප්පුවේ දිග - අඩියක් පමණ
- තට්ටුව සඳහා - එළුහම්, හරක් හම්
- වරපටි - ලණු


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk